# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2354/17 - 2023 ඔක්තෝබර් මස 18 වැනි බදාදා - 2023.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 115017 දරන සහ අංක 495, මිනුවන්ගොඩ පාර, බෝලවලාන, මීගමුව යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2023 ජූලි මස 31 දින අංක 2343/03 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "පූර්ව ළමාවිය අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (SLQF 6 වන මට්ටම) අලෙවි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්,

   ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ;

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ආයතනය පිළිගනු ලැබේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| අලෙවි කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය | බීබීඑම් ගෞරව (අලෙවි කළමනාකරණය) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0184

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.